# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2261/52 - 2022 ජනවාරි මස 06 වැනි බ්‍රහස්පතින්දා - 2022.01.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී- 3/2013(ii).

**1971 අංක 52 දරන වෙළඳ නැව් පනත**

1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 139 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 321 වන වගන්තිය යටතේ වරාය හා නාවික අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**රෝහිත අබේගුණවර්ධන,**
වරාය හා නාවික අමාත්‍ය.

2021 දෙසැම්බර් මස 29 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. (1) මේ නියෝග 2021 අංක 4 දරන වෙළඳ නැව් (ජීවිතාරක්ෂක මෙවලම් සහ වැඩපිළිවෙල සැලසුම්) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) 1974 මුහුදේ දී ජීවිතරක්ෂාව සඳහා වූ ජාත්‍යන්තර සම්මුතියේ III වන පරිච්ඡේදය, කලින් කලට සංශෝධිත පරිදි වන 1988 ප්‍රොටොකෝලය සහ එම ප්‍රොටොකෝලයට පසුව සිදු කරනු ලබන සංශෝධන සහ කලින් කලට සංශෝධිත පරිදි වන ජාත්‍යන්තර ජීවිතාරක්ෂක උපකරණ (LSA) සංග්‍රහය බලාත්මක කිරීම මේ නියෝගයන්හි කාර්යය විය යුතු ය.


1A - G 35891 — 510 (2022/01)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

### I වන කොටස

*මෙම නියෝගවල අදාළත්වය*

2\. (1) මේ නියෝගයේ (2), (3), (4) සහ (5) වන අනු නියෝගවල විධිවිධානවලට යටත්ව, මේ නියෝග, ශ්‍රී ලංකා ධජය දැරීමට හිමිකම් ඇති ජාත්‍යන්තර මුහුදු ගමන්හි නිරතවන නැව් සඳහා සහ ශ්‍රී ලංකා ජල තීරයේ ගමන් කරන වෙනත් යම් විදේශීය නැව් සඳහා අදාළවිය යුතු ය.

(2) (මෙම නියෝගයන්හි "සම්මුතිය යනුවෙන් හඳුන්වනු ලබන) 1974 මුහුදේ දී ජීවිතාරක්ෂාව සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය, 1988 ප්‍රොටොකෝලය, වෙනත් යම් ආකාරයකින් ප්‍රකාශිතව ම සඳහන් කර ඇති පරිදි හැර මේ නියෝගඃ

(*අ*) යුධ නැව් සහ හමුදා නැව් සඳහා;
(*ආ*) දළ ටොන් බර 500 ට අඩු භාණ්ඩ නැව් සඳහා;
(*ඇ*) යාන්ත්‍රික ක්‍රම මගින් ප්‍රචලනය නොකරන නැව් සඳහා;
(*ඈ*) ප්‍රාථමික ලෙස ඉදි කරන ලද දැවමය නැව් සඳහා;
(*ඉ*) වෙළඳාමේ නිරත නොවන විනෝද ගමන් යාත්‍රා සඳහා; සහ
(*ඊ*) ධීවර යාත්‍රා සඳහා,

අදාළ නොවිය යුතු ය.

(3) සම්මුතියේ අන්‍යාකාරයෙන් ප්‍රකාශිතව ම විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, මේ නියෝගයන්හි විධිවිධාන, 1998 ජූලි මස 1 වන දින හෝ ඉන් පසු තොටුතලය තනනු ලැබූ හෝ ඒ හා සමාන අවස්ථාවක තොටුතලය පවතින්නා වූ නැව් සඳහා අදාළ විය යුතු ය.

(4) 1988 ජූලි මස 1 වන දිනට පෙර තනනු ලැබූ නැව් සම්මුතියේ III වන පරිච්ඡේදයේ 1 (4) සහ (5) වන නියෝගයන්හි නිශ්චිතව දක්වා ඇති නියෝග සමග අනුකූල විය යුතු ය

(5) සම්මුතියේ V වන පරිච්ඡේදයේ ප්‍රකාශිතව ම විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, මේ නියෝගවල විධිවිධාන, උතුරු ඇමරිකාවේ මහා විල්වල සහ කැප් ඩෙස් රොසියර්ස් සිට ඇන්ටිකොස්ට් දූපතේ බටහිර තුඩුව දක්වා අඳිනු ලබන ඍජු රේඛාවක නැගෙනහිරට වන්නට පිහිටි ශාන්ත ලෝරන්ස් ගංගාව හරහා 63 වන දේශාංශකයේ ඇන්ටිකොස්ට් දූපතේ උතුරු ප්‍රදේශයේ තනිව යාත්‍රා කරන ශ්‍රී ලාංකික නැව් සඳහා අදාළ නොවිය යුතු ය.

3\. (1) සාමාන්‍යයෙන් ජාත්‍යන්තර මුහුදු ගමන්වල නොයෙදෙන, නමුත් විශේෂ අවස්ථානුගත කරුණුවල දී තනි ජාත්‍යන්තර මුහුදු ගමනක් යාම සඳහා නියම කරනු ලබන නැවක්, (මේ නියෝගවල "අධ්‍යක්ෂ-ජනරාල්වරයා" ලෙස සඳහන් කරනු ලබන) වෙළඳ නැව් අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, මේ නියෝග වල සඳහන් යම් නියමවලින් නිදහස් කරනු ලැබිය හැකි ය.

එසේ වුව ද අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ මතය අනුව නැව විසින් සිදු කරනු ලැබිය යුතු මුහුදු ගමන් සඳහා ප්‍රමාණවත් වන ආරක්ෂක නියමයන්ට එකී නැව අනුකූල විය යුතු ය.

(2) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, ජාත්‍යන්තර මුහුදු ගමන්හි යෙදෙන නැව්වල යම් නවීන අංග වැඩි දියුණු කිරීම සම්බන්ධ පර්යේෂණ සහ නැවක එම අංග අන්තර්ගත කිරීම පිළිබඳ පර්යේෂණවලට බරපතල බාධාවක් විය හැකි ලෙස අදාළ වන සම්මුතියේ II - 1, II - 2, II සහ IV වන පරිච්ඡේදවල යම් විධිවිධානවලින් නවීන අංගෝපාංග අන්තර්ගත වන යම් නැවක් නිදහස් කරනු ලැබිය හැකි යඃ

එසේ වුව ද, නැව මගින් ලබාදීමට අපේක්ෂිත සේවාව ලබාදීම සඳහා ප්‍රමාණවත් වන බවට නැවේ සම්පූර්ණ ආරක්ෂාව පිළිබඳව සහතික කිරීම සඳහා වන බවට අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ මතය වන සහ නැව ගමන් කරනු ලබන රාජ්‍යයන්ගේ රජයන් විසින් පිළිගන්නා ලද ආරක්ෂක නියමයන්ට අනුකූලව එකී නැව් කටයුතු සිදු කරනු ලැබිය යුතු ය.

(3) මුහුදු ගමනේ ආරක්ෂිත ස්වභාවය සහ තත්ත්වය, සම්මුතියේ III පරිච්ඡේදයේ වන යම් විශේෂිත නියම අදාළ වීම අසාධාරණ හෝ අනවශ්‍ය බවට පත්කරන පරිද්දෙන් වන බවට අධ්‍යක්ෂ-ජනරාල්වරයා සලකනු ලබන්නේ නම්, ඔහු විසින් එම නැව්වල මුහුදු ගමන සිදුවන අතරතුර දී ඊට ආසන්නතම භූමියේ සිට සැතපුම් 20 කට වඩා දුරින් ගමන් නොකරන තනි ශ්‍රී ලංකා නැව් හෝ ශ්‍රී ලංකා නැව් පන්ති මෙකී නියමවලින් නිදහස් කරනු ලැබිය හැකි ය.

(4) මේ නියෝගය යටතේ නැවක් නිදහස් කරන අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් (මේ නියෝගයන්හි "සංවිධානය" ලෙස සඳහන් කරනු ලබන) ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානය වෙත එහි විස්තර සහ එකී නිදහස් කිරීමට හේතු දැනුම් දිය යුතු ය.

(5) සම්මුතියේ II වන පරිච්ඡේදයේ 20.6.2 නියෝගයට අනුව, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එන්ජිමක් පනගැන්වීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කරනු ලබන අවම උෂ්ණත්වයට වඩා අවට ප්‍රදේශයේ උෂ්ණත්වය ඉහළ මට්ටමක ඇත්නම්. මිනිත්තු 3 කට වඩා නොඅඩු මුළු කාලසීමාවක් සඳහා ක්‍රියාත්මක කළයුතු ජීවිතාරක්ෂක බෝට්ටු සහ මුදවා ගැනීමේ බෝට්ටුවල සියලු එන්ජිම් සඳහා වන නියම හා අත්හරිනු ලැබිය හැකි ය. එකී අත්හැරීමක 1986 ජූලි මස 01 වන දිනට පෙර තනනු ලැබූ නැව් සඳහා පමණක් අවසර ලබා දෙනු ලැබිය හැකි ය.

(6) මේ නියෝගවල සඳහන් කරනු ලැබූ නිදහස් කිරීම් 2022. 01. 06 දිනැති අංක 2261/49 දරන *ගැසට්* පත්‍රයේ පළකරනු ලැබූ 2021 අංක 01 දරන වෙළෙඳ නැව් (සමීක්ෂණ සහ සහතික) නියෝගයන්ට අනුකූලව නිකුත් කරනු ලැබිය යුතු ය.

(7) සම්මුතියේ III වන පරිච්ඡේදය මගින් නියම කරනු ලැබූ අනුමතියක් හෝ ආදර්ශ අනුමතියක් හෝ සම්මුතියේ III වන පරිච්ඡේදය මගින් අවසර ලබා දෙනු ලැබූ ඊට සමාන විධිවිධානයක් හෝ අත්හැරීමක්;

(*අ*) එය ලිඛිතව ඇත්නම්;
(*ආ*) එය බලාත්මක වන දිනය එහි නිශ්චිතව දක්වා ඇත්නම්;
(*ඇ*) එහි සඳහන් යම් කොන්දේසින්ට අනුකූලව කටයුතු කර ඇත්නම්,

පමණක් වලංගු විය යුතු ය.

(8) මේ නියෝග යටතේ ප්‍රදානය කරනු ලැබූ යම් නිදහස් කිරීමක්,අනුමතයක් හෝ අත්හැරීමක්, සාධාරණ දැනුම් දීමකින් පසු, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් වෙනස් කිරීම හෝ අවලංගු කිරීම කළ හැකි ය.

4. වන්දනාකරුවන් සඳහා වන ව්‍යාපාර වැනි විශේෂ ව්‍යාපාරවලට අයත් මගීන් විශාල ප්‍රමාණයක් ප්‍රවාහනය කිරීම සඳහා විශේෂ ව්‍යාපාරයන්හි යොදවනු ලැබූ මගී නැව් සම්බන්ධයෙන් වන විට දී එකී නැව් සම්මුතියේ III වන පරිච්ඡේදයේ නියමයන්ට අනුකූලව ක්‍රියාත්මක කිරීම ප්‍රායෝගික නොවන බවට අධ්‍යක්ෂ-ජනරාල්වරයා සෑහීමකට පත්වන්නේ නම්, ඔහු විසින්, එකී නැව්-

(i) 1971, විශේෂ ව්‍යාපාර මගී නැව් ගිවිසුමට අමුණා ඇති රීති; සහ
(ii) 1972 විශේෂ ව්‍යාපාර මගී නැව් සඳහා වන අවකාශ අවශ්‍යතා පිළිබඳ ප්‍රොටොකෝලයට අමුණා ඇති රීති,

යන විධිවිධාන සමග සම්පූර්ණයෙන් අනුකූල වන්නේ නම් එම නැව් මෙම නියමයන්ගෙන් නිදහස් කරනු ලැබිය හැකිය.

## II වන කොටස

### *ජීවිතාරක්ෂක උපකරණ සහ වැඩපිළිවෙළ*

5. මේ නියෝග අදාළ වන නැවක් සම්මුතියේ විස්තර කරන ලද නැවකට අදාළව එහි III වන පරිච්ඡේදයේ සඳහන් කර ඇති ජීවිතාරක්ෂක මෙවලම් සහ සැලසුම් නියමයන්, සමඟ අනුකූල විය යුතු ය.

6. නැව මත වන සියලු ජීවිතාරක්ෂක මෙවලම් සහ වැඩපිළිවෙළ, LSA සංග්‍රයේ අදාළ වන නියම සමඟ අනුකූල විය යුතු ය.

7. (1) සම්මුතියේ III වන පරිච්ඡේදයේ නියම සමඟ නැවේ සියලු ජීවිතාරක්ෂක මෙවලම් සහ වැඩ පිළිවෙළ අනුකූල වන බව තහවුරු කිරීම සඳහා සංවිධානයේ නිර්දේශවලට අනුකූලව හෝ එකී නිර්දේශයන්හි සඳහන් කර ඇති පරීක්ෂණ අධ්‍යක්ෂ-ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි සාර්ථක ලෙස සිදුකර ඇති බව තහවුරු කිරීම සඳහා පරීක්ෂා කරනු ලැබිය යුතු ය.

(2) නැවේ සවි කරනු ලැබූ නවීන ජීවිතාරක්ෂක මෙවලම් සහ වැඩපිළිවෙළ -

(*අ*) අවම වශයෙන් සම්මුතියේ III වන පරිච්ඡේදයේ සහ LSA සංග්‍රයේ නියමයන්ට සමාන ආරක්ෂිත ප්‍රමිති සපයනු ලැබිය යුතු අතර සංවිධානය විසින් සකස් කරනු ලැබූ මාර්ගෝපදේශ මත පදනම්ව ඇගයීම සහ පරීක්ෂා කිරීම සිදු කරනු ලැබිය යුතු ය.

(*ආ*) සම්මුතියේ III වන පරිච්ඡේදයේ 38 වන නියමයට අනුව ඉංජිනේරු විශ්ලේෂණයක් ඇගයීමක් සහ අනුමැතියක් සඳහා සාර්ථකව භාජනය වී තිබිය යුතු ය.

(3) LSA සංග්‍රහය මගින් සවිස්තරාත්මක විශේෂාංග ඇතුළත් කර නොමැති සම්මුතියේ III වන පරිච්ඡේදය මගින් තිබිය යුතු බවට නියම කර ඇති ජීවිතාරක්ෂක මෙවලම් පිළිබඳව අධ්‍යක්ෂ-ජනරාල්වරයා සෑහීමකට පත්විය යුතු ය.

8. (1) සම්මුතියේ III වන පරිච්ඡේදය හෝ LSA සංග්‍රහය මගින් යමක් සඳහා ආදර්ශ අනුමතයක් තිබිය යුතු බවට නියම කරන්නේ නම්, සම්මුතියේ III වන පරිච්ඡේදයේ 4 වන නියෝගයේ විධිවිධානවලට අනුකූලව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ආදර්ශ අනුමතියක් ලබා දිය යුතු ය.

(2) මේ නියෝගයේ (1) වන අනු නියෝගය ප්‍රකාරව, පිළිගත් සංවිධානයක් හෝ එක්සත් ජනපද වෙරළාරක්ෂක විසින්, එක්සත් රාජධානියේ සමුද්‍රීය වෙරළාරක්ෂක නියෝජ්‍යායතනය හෝ ජපානයේ සමුද්‍රීය පරිපාලනය විසින් ප්‍රදානය කරනු ලැබූ උපකරණ අනුමතයන් අධ්‍යක්ෂ-ජනරාල්වරයා පිළිගන්නා අතර එකී අනුමතයන් සම්මුතියේ නියමයන් සමග සම්පූර්ණයෙන් අනුකූල වන බව දක්වනු ලැබේ. තව ද යුරෝපීය සංගමයේ සමුද්‍ර උපකරණ විධානවල සහතික කිරීමේ කාර්යය පටිපාටිය යටතේ අනුමත කර ඇති උපකරණ ද අධ්‍යක්ෂ-ජනරාල්වරයා පිළිගනු ලබයි.

## III වන කොටස

### *මෙහෙයුම් සූදානම, නඩත්තුව සහ පරීක්ෂා කිරීම*

9. (1) වරායකින් නැවක් පිටත්වීමට පෙර සහ මුහුදු ගමන අතරතුර සෑම විටදීම ජීවිතාරක්ෂක මෙවලම් සියල්ලක්ම වැඩකරන ආකාරයෙන් තිබිය යුතු අතර ක්ෂණික භාවිතය සඳහා සූදානම් විය යුතු ය.

(2) නැවක ඇති ජීවිතාරක්ෂක උපකරණවල නඩත්තුව, පරීක්ෂාව සහ පරීක්ෂා කිරීම් සම්මුතියේ III වන පරිච්ඡේදයේ 20 වන නියෝගයේ දක්වා ඇති පරිදි සිදුකරනු ලැබිය යුතු ය.

(3) නැවේ ජීවිතාරක්ෂක මෙවලම් නඩත්තුව කිරීම සඳහා සම්මුතියේ III වන පරිච්ඡේදයේ 36 වන නියෝගයට අනුකූලව උපදෙස් ලබාදිය යුතු අතර ඒ අනුව නඩත්තු කිරීම සිදු කරනු ලැබිය යුතු ය.

(4) අධික පාවිච්චිය හෝ පරිහරණය සඳහා භාජනය වූ සහ විධිමත්ව ප්‍රතිෂ්ඨාපනය කිරීම අවශ්‍ය ජීවිතාරක්ෂක මෙවලම් සහ එහි කොටස් සඳහා අමතර කොටස් සහ අලුත්වැඩියා උපකරණ සපයනු ලැබිය යුතු ය.

(5) සම්මුතියේ III වන පරිච්ඡේදයේ 36 වන නියෝගයේ නියම ඇතුළත් වන්නා වූ නැවත සැලසුම් කළ නඩත්තු වැඩසටහන 3 වන අනු නියෝගයේ නියමයන්ට අනුකූලව අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් පිළිගනු ලැබිය හැකි ය.

10. (1) නැවේ සෑම සුළං පිරවිය හැකි ජීවිතාරක්ෂක බෝට්ටුව, සුළං පිරවිය හැකි ජීවිතාරක්ෂක ජැකට් සහ සමුද්‍රීය ඉවත් කිරීමේ පද්ධතිය,

(*අ*) මාස 12 නොඉක්මවන කාල පරාසයක දී. එසේ වුව ද මෙය ප්‍රායෝගික නොවන යම් අවස්ථාවක දී අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් මෙකී කාලසීමාව මාස 17 ක් දක්වා දීර්ඝ කරනු ලැබිය හැකි කාල පරාසයක දී; සහ

(*ආ*) එකී දේ අලුත්වැඩියා කිරීම සඳහා සුදුසුකම් ඇති, නිසි අලුත්වැඩියා කිරීමේ පහසුකම් පවත්වාගෙන යන නිසි පුහුණුවක් ලද සේවක පිරිස් පමණක් යොදා ගන්නා අනුමත කරන ලද අලුත්වැඩියා කිරීමේ ස්ථානයක දී,

අලුත්වැඩියා කරනු ලැබිය යුතු ය.

(2) මේ නියෝගයේ (1) වන අනු නියෝගය මගින් නියම කරනු ලැබූ සමුද්‍රීය ඉවත් කිරීමේ පද්ධතියේ අලුත්වැඩියා කිරීමේ කාල පරාසයට අමතරව සහ එකී කාල පරාසයට සමගාමීව එක් එක් සමුද්‍රීය ඉවත් කිරීමේ පද්ධතිය චක්‍රීය පදනමක් මත නැව මගින් යොදවා ගනු ලැබිය යුතු ය. එක් එක් පද්ධතිය සෑම වසර හයකට අවම වශයෙන් එක් වරක් යොදවා ගනු ලැබිය යුතු ය.

(3) 9 වන නියෝගය ප්‍රකාරව අලුත් සහ නවීන සුළං පිරවිය හැකි ජීවිතාරක්ෂක බෝට්ටු වැඩපිළිවෙළ අනුමත කරන අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් පහත දැක්වෙන කොන්දේසි මත දීර්ඝ කරනු ලැබූ අලුත් වැඩියා කිරීමේ කාල පරාසයන් සඳහා ඉඩ ලබාදිය හැකි යඃ-

(අ) අලුත්වැඩියා කිරීමේ කාල පරාසය තුළ දී පරීක්ෂා කිරීමේ කාර්ය පටිපාටිය මගින් නියම කර ඇති පරිදි, ඊට සමාන ප්‍රමිතීන් දීර්ඝ කරනු ලැබූ අලුත්වැඩියා කිරීමේ කාලසීමාව තුළ පවත්වාගෙන යාම පිළිබඳ අලුත් සහ නවීන ජීවිතාරක්ෂක බෝට්ටු වැඩපිළිවෙළ තහවුරු කර තිබිය යුතු ය;

(ආ) මේ නියෝගයේ (1) වන අනු නියෝගයට අනුව ජීවිතාරක්ෂක බෝට්ටු පද්ධතිය නැව් තට්ටුව මත දී පරීක්ෂා කරනු ලැබිය යුතු ය; සහ

(ඇ) වසර පහක් නොඉක්මවන කාල පරාසයක දී, සංවිධානයේ නිර්දේශයන්ට, අනුකූලව අලුත්වැඩියා සිදු කරනු ලැබිය යුතු ය.

(4) සුළං පුරවන ලද මුදවා ගැනීමේ බෝට්ටුවල සියලු අලුත්වැඩියා කිරීම් සහ නඩත්තුව නිෂ්පාදකයාගේ උපදෙස්වලට අනුව සිදු කරනු ලැබිය යුතු ය. හදිසි අලුත්වැඩියා කිරීම් නැවේ නැව් තට්ටුව මත සිදු කරනු ලැබිය හැකි ය; එසේ වුව ද, ස්ථිර අලුත්වැඩියා කිරීම් අනුමත කරන ලද අලුත්වැඩියා කිරීමේ ස්ථානයේ දී සිදු කරනු ලැබිය යුතු ය.

(5) මේ නියෝගයේ (3) වන අනු නියෝගයට අනුව ජීවිතාරක්ෂක බෝට්ටු අලුත්වැඩියා කිරීමේ කාලපරාසය දීර්ඝ කිරීම සඳහා අවසර ලබා දෙන අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් සම්මුතියේ I වන පරිච්ඡේදයේ 5 (ආ) වන නියෝගයට අනුව එකී කටයුත්ත පිළිබඳ සංවිධානය වෙත දැනුම් දිය යුතු ය.

(6) ද්‍රවස්ථිතික මුදාහැරීමේ ඒකකවල කලින් කල සිදුවන අලුත්වැඩියා කිරීම්, මෙවලම් දියත් කිරීම සහ බර මුදාහැරීමේ ආම්පන්න, සම්මුතියේ III වන පරිච්ඡේදයේ 20 වන නියෝගයේ 9 වන සහ 11 වන පරිච්ඡේදයන්හි විධිවිධානවලට අනුකූලව විය යුතු ය.

(7) නාවික කපිතාන් හෝ හිමිකරුවන් විසින් ජීවිතාරක්ෂක බෝට්ටු සහ මුදවා ගැනීමේ බෝට්ටුවල නඩත්තු කිරීම, පූර්ණ විමර්ෂණ මෙහෙයුම් පරීක්ෂා කිරීම සහ මෙවලම් දියත් කිරීම සහ නැවත නැව් තට්ටුව මත වන ආම්පන්න මුදාහැරීම, MSC 402 (96) යෝජනා සම්මතයේ විධිවිධාන සහ සංවිධාන විසින් සම්මත කරන ලද වෙනත් මාර්ගෝපදේශ හා සම්මුතියේ II වන පරිච්ඡේදයේ 20 වන නියෝගයට අනුකූලව පවත්වාගෙන යනු ලබන බවට සහතික විය යුතු ය.

(8) මේ නියෝගයේ (7) වන අනු නියෝගයේ සඳහන් නඩත්තු කිරීම, පූර්ණ විමර්ශනය මෙහෙයුම් පරීක්ෂා කිරීම, සුපරික්ෂා කිරීම සහ අලුත්වැඩියා කිරීම සිදු කරන සේවක පිරිස්, MSC 402 (96) නියෝගයේ නිශ්චිතව දක්වා ඇති නියම සහ සංවිධානය විසින් සම්මත කරන ලද වෙනත් මාර්ගෝපදේශ අනුකූලව අනුමත කරන ලද සේවා සපයන්නකු විසින් සහතික කරනු ලැබිය යුතු ය.

(9) කිසිම තැනැත්තකු (8) වන අනු නියෝගයේ නිශ්චිතව දක්වා ඇති පරිදි සේවා සපයන්නකු, ලෙස අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් ඔහුට බලය ලබා දී ඇත්නම් මිස, ශ්‍රී ලංකාව තුළ කටයුතු කරනු නොලැබිය යුතු ය.

(10) MSC 402 (96) යෝජනා සම්මතයෙහි නිශ්චිතව දක්වා ඇති නියමයන් සහ සංවිධානය මගින් සම්මත කරනු ලැබූ වෙනත් මාර්ගෝපදේශ පිළිපදින යම් සේවා සපයන්නකු මේ නියෝග ප්‍රකාරව අනුමත කරන ලද සේවා සපයන්නකු වශයෙන් අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් පිළිගනු ලැබිය යුතු ය.

(11) සේවා සපයන්නකුගේ සාර්ථක ආරම්භක විගණක පරීක්ෂණයකින් පසු ඔහු විසින් සැපයිය යුතු සේවාවන්හි විෂයය පථය නිර්වචනය කරමින් (උදා:- නිෂ්පාදන සහ උපකරණ වර්ග) බලය පැවරීමේ ලේඛනයක් අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් සෑම අනුමත කරන ලද සේවා සපයන්නකු වෙතම නිකුත් කරනු ලැබිය යුතු ය. කල් ඉකුත්වීමේ දිනය ලේඛනයෙහි ඉතා පැහැදිලිව සඳහන් කළ යුතු ය.

(12) MSC 402 (96) යෝජනා සම්මතයේ නියමයන් සහ සංවිධානය මගින් සම්මත කරනු ලැබූ වෙනත් මාර්ගෝපදේශ පවත්වාගෙන යනු නොලබන සේවා සපයන්නකුගේ එම සැපයුම්කරුගේ බලය, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් ඉවත් කරනු ලැබිය යුතු ය.

(13) වෙනත් ගිවිසුම්ගත රජයයන් විසින් හෝ අනුමත කරන ලද පිළිගත් සංවිධාන මගින් බලය ලබාදෙනු ලැබූ සේවා සපයන්නන් අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් පිළිගැනීම හෝ හඳුනා ගැනීම කළ හැකි ය.

(14) අනුමත කරන ලද සේවා සපයන්නකු සම්බන්ධ තොරතුරු ලබා ගත හැකි බවට අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් සහතික විය යුතු ය.

## IV වන කොටස

### *හදිසි පුහුණුව සහ අභ්‍යාස*

11\. (1) හදිසි කාර්යයන් පවරනු ලැබූ නැවක සෑම නාවික සාමාජිකයකු ම මුහුදු ගමන ආරම්භ කිරීමට පෙර එකී කාර්යයන් සම්බන්ධයෙන් පළපුරුදු විය යුතු ය.

(2) නැවේ ආරක්ෂිත සවි කිරීම් සම්බන්ධ පළපුරුද්ද ප්‍රායෝගික පෙරට්ටු සහ නැවෙහි අභ්‍යාස පුහුණුවීම් සිදු කිරීම සහ උපදෙස් ලබාදීම සම්මුතියේ III වන පරිච්ඡේදයේ 19 වන සහ 30 වන නියෝගවලට අනුකූලව සිදු කරනු ලැබිය යුතු ය.

(3) සම්මුතියේ III වන පරිච්ඡේදයේ 35 වන නියෝගයේ 3 වන ඡේදයේ නියම සමඟ අනුකූල වන පුහුණු අත්පොතක්, එක් එක් නාවික පිරිස් භෝජනාගාරයේ සහ විනෝද ක්‍රීඩාගාරයේ හෝ එක් එක් නාවික කුටියේ සපයනු ලැබිය යුතු ය.

(4) සම්මුතියේ III වන පරිච්ඡේදයේ 37 වන නියෝගයට අනුකූලව සෑම නැවක ම නැව් තට්ටුව මත පෙරට්ටු ලයිස්තුවක් සහ හදිසි අවස්ථා උපදෙස් තිබිය යුතු ය.

(5) පෙරට්ටු පවත්වනු ලැබූ දිනය නැව අත්හැරීමේ විස්තර සහ අභ්‍යාස සහ ගිනි අභ්‍යාස, ආවරණ කරන ලද අවකාශ ප්‍රවේශ සහ මුදවා ගැනීමේ අභ්‍යාස, වෙනත් ජීවිතාරක්ෂක මෙවලම් අභ්‍යාස සහ නැව් තට්ටුව මත පුහුණු වීම්, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නියම කරනු ලැබූ ශ්‍රී ලංකා නැවක නැව් තට්ටුව මත වන නිල සටහන් පොතක හෝ නැවෙහි ප්‍රදර්ශනය වන ධජය අයත් රාජ්‍ය විසින් නියම කරනු ලැබිය හැකි යම් සටහන් පොතක වාර්තා කරනු ලැබිය යුතු ය. නියම කරන ලද කාලයේ දී පෙරට්ටු, අභ්‍යාස හෝ පුහුණු සැසිවාර පවත්වනු නොලැබුවේ නම් ඊට අදාළ කරුණු සහ පෙරට්ටු, අභ්‍යාස හෝ පුහුණු සැසිවාර පවත්වනු ලැබූ ප්‍රමාණය දක්වමින් පොතෙහි සටහනක් ඇතුළත් කරනු ලැබිය යුතු ය.

## V වන කොටස

### *සාමාන්‍ය විධිවිධාන*

12\. (1) විකල්ප සැලසුම සහ වැඩපිළිවෙළ අදාළ නියමයන්හි අභිප්‍රාය සපුරාලීම සහ සම්මුතියේ III වන පරිච්ඡේදයේ ආ කොටසේ නිර්දේශක නියමවලින් බැහැර වන විට, ඉංජිනේරු විශ්ලේෂණයක්, ඇගයීමක් සහ සැලසුම් සහ වැඩපිළිවෙළ පිළිබඳ අනුමතයක් සම්මුතියේ III වන පරිච්ඡේදයේ ආ කොටසේ දක්වා ඇති නියමවලින් බැහැරව විය හැකි ය.

(2) විකල්ප සැලසුම හෝ වැඩපිළිවෙළ සම්මුතියේ III වන පරිච්ඡේදයේ ආ කොටසේ නිර්දේශක නියමවලින් බැහැර වන විට, ඉංජිනේරු විශ්ලේෂණයක්, ඇගයීමක් සහ සැලසුම් සහ වැඩපිළිවෙළ පිළිබඳ අනුමතයක් සම්මුතියේ III වන පරිච්ඡේදයේ 38 වන නියෝගයට අනුව සිදු කරනු ලැබිය යුතු ය.

13\. පරිපාලනය පිළිබඳ සෑහීමට පත්වීම සඳහා සම්මුතියේ III වන පරිච්ඡේදයේ සඳහන් කිරීම් සිදු කර ඇති විට හෝ අධ්‍යක්ෂ-ජනරාල්වරයා සෑහීමට පත්වීම සඳහා මේ නියෝගයන්හි සඳහන් කිරීම් සිදු කර ඇති විට අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති හරහා එකී සඳහන් කිරීම් සඳහා සෘජු අර්ථකතන සපයා නොමැති අවස්ථා සම්බන්ධ අවස්ථාවල දී වර්ගීකරණ සමිති පිළිබඳ ජාත්‍යන්තර සංග්‍රහයේ එකීය අර්ථ නිරූපණ, අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ අර්ථ නිරූපණය වශයෙන් සලකනු ලැබිය යුතු ය.

14\. ශ්‍රී ලංකාවේ පිහිටි යම් වරායක හෝ ස්ථානයක ඇති යම් නැවක්, අනාරක්ෂිත නැවක් ලෙස හඳුනාගනු ලබන අවස්ථාවක දී, එනම් එවැනි නැවක නැව් බඳේ, උපකරණවල, යන්ත්‍රසූත්‍රවල, සේවකයන් නිසි ප්‍රමාණය නොසිටීම දෝෂ සහගත තත්ත්වයක්, අධිකව පැටවීම හෝ නුසුදුසු පැටවීම හෝ සම්මුතිය සමඟ අනුකූල නොවන වෙනත් යම් තත්ත්වයක් හේතුවෙන්, එකී නැව සිදු කිරීමට අදහස් කරන සේවයේ ස්වභාවය අනුව මිනිස් ජීවිතවලට බරපතල හානි සිදු නොකරමින් මුහුදට ගමන් කිරීමට නොහැකි වන යම් අවස්ථාවක දී, එහි දෝෂ සහගත තත්ත්වය සමීක්ෂණය කිරීමේ හෝ එම දෝෂය නිවැරදි කිරීමේ කාර්යය සඳහා එකී නැව තාවකාලිකව රඳවා තබා ගනු ලැබිය හැකි ය.

15\. සම්මුතියේ III වන පරිච්ඡේදයේ පාදක සටහන් සහ එකී පාදක සටහන්හි සඳහන් කරනු ලැබූ යෝජනා සම්මත, චක්‍රලේඛ හෝ ලේඛන, මේ නියෝගයන්හි කොටසක් ලෙස සලකනු ලැබිය යුතු ය.

16. අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් අමාත්‍යාවරයාගේ එකඟත්වය ඇතිව, මේ නියෝගයන්හි විධිවිධාන බලාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි සම්මුතියේ හෝ 1988 ප්‍රොටොකෝලයේ විධිවිධානයන්හි අවම තාක්ෂණික ප්‍රමිතීන්ට අනුකූලව ක්‍රියා කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන් නිකුත් කරනු ලැබිය හැකි ය.

17. මේ නියෝගයන් හි -

"සම්මුතිය" යන්නෙන්, 1974 මුහුදේ දී ජීවිතාරක්ෂාව සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය, කලින් කල සංශෝධිත පරිදි වන 1988 ප්‍රොටොකෝලය සහ එම ප්‍රොටොකෝලයට පසුව සිදු කරනු ලබන සංශෝධන අදහස් වේ;

"මෙවලම් හෝ වැඩපිළිවෙල දියත් කිරීම" යන්නෙන්, ගලවා ගැනීමේ යාත්‍රාවක් හෝ මුදවා ගැනීමේ බෝට්ටුවක් එය නවතා තබා ඇති ස්ථානයේ සිට ආරක්ෂිතව ජලයට මාරු කිරීම අදහස් වේ;

"LSA සංග්‍රහය" යන්නෙන්, සංවිධානය විසින් සංශෝධනය කරනු ලැබිය හැකි පරිදි MSC 48 (66) යෝජනා මගින් සංවිධානය විසින් සම්මත කරන ලද ජාත්‍යන්තර ජීවිතාරක්ෂක උපකරණ සංග්‍රහය අදහස් වේ;

"සමුද්‍රීය ඉවත් කිරීමේ පද්ධතිය" යන්නෙන්, නැවකට නගින තට්ටුවේ සිට පාවෙන ගලවා ගැනීමේ යාත්‍රාවකට පුද්ගලයන් ඉක්මනින් මාරු කිරීම සඳහා වන මෙවලමක් අදහස් වේ;

"අලුත් ජීවිතාරක්ෂණ මෙවලම් හෝ වැඩපිළිවෙල" යන්නෙන්, සම්මුතියේ III වන පරිච්ඡේදයේ හෝ LSA සංග්‍රහයේ විධිවිධාන මගින් සම්පූර්ණයෙන් ආවරණය නොවූ නමුත් එයට සමාන හෝ ඉහළ මට්ටමක ආරක්ෂාවක් සපයන අලුත් අංගයන්ගෙන් සංචිත ජීවිතාරක්ෂක මෙවලමක් හෝ වැඩපිළිවෙළක් අදහස් වේ;

"සංවිධානය" යන්නෙන්, ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානය අදහස් වේ;

"මගී නැව" යන්නෙන්, මගීන් දොළොස් දෙනෙකුට වැඩියෙන් රැගෙන යන නැවක් අදහස් වේ;

"මුදවා ගැනීමේ බෝට්ටුව" යන්නෙන්, විපතටපත් පුද්ගලයන් මුදවා ගැනීම සඳහා සහ ගලවා ගැනීමේ යාත්‍රා එක්රැස් කිරීම සඳහා නිර්මාණය කරනු ලැබූ බෝට්ටුවක් අදහස් වේ;

EOG 1 - 0244

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.